# ස්වයංපෝෂණයට උරදුන්

# ගොඩ ගොවිතැන

සම්ප්‍රදායානුගත ස්වයංපෝෂිත සමාජ ක්‍රමයක් පැවති පෙරදිග රටවල් වෙත ඈත දූරාතීතයේ සිටම විදේශිකයන් වෙළඳාම පිණිස පැමිණි බව ඉතිහාස ග්‍රන්ථ මෙන්ම ඓතිහාසික පුරා විද්‍යාත්මක සෙල්ලිපි, ටැම්ලිපි හා විවිධ කෘෂි වර්ග වලින් හෙළිදරව් වේ. ගොඩ බිම් මාර්ග ආශ්‍රය කරගෙන පැමිණි මෙම වෙළඳ කණ්ඩායම් පෙරදිගට පැමිණ ඉන් නොනැවතී චීනය වැනි ඈත පෙරදිග රටවලට ගිය බවත් කොන්ස්තන්තිනෝපල් වැනි ප්‍රධාන වෙළෙඳ නගර පෙරදිග හා අපරදිග සම්බන්ධ කරන වෙළඳ මාර්ගයන් අතර ගොඩනැගී තිබූ බවත් පෙනේ.

විශේෂයෙන් මෙම පෙරදිග වෙළඳාම මුල් යුගයේ සිට නතු කරගෙන කටයුතු කළේ මුස්ලිම් වරුන් විසිනි. ඔවුන් පෙරදිග රටවල් බොහොමයකට මෙන් ශ්‍රී ලංකාවටද පැමිණ කරාබුනැටි, ගම්මිරිස් ප්‍රධාන කොටගත් විවිධ කුළුබඩු වර්ග අපරදිග රටවලට ගෙන ගිය බව පෙනේ. විශේෂයෙන් එවැනි යුගයකදී ශ්‍රී ලාංකික සමාජය ස්වයංපෝෂිත ජීවන රටාවක් පැවති සමාජයක් වශයෙන් දක්විය හැකි අතර තම ගෙවත්තේ අතිරික්ත නිෂ්පාදනය මෙසේ වෙළඳාම සඳහා යෙදවූයේ හදෙක් වාණිජ පරමාර්ථයන් පෙරදැරි කර ගෙන නොවේ. එහෙත් විවිධ දේශපාලනික හා ආර්ථික හේතූන් මත අපරදිගට ඇතුල්විය හැකි ගොඩ බිම් මාර්ග වැසී යාමත් සමගම අධිරාජ්‍යවාදී මංකොල්ලය ආරම්භ විය. ජල රකුසාට නොබියව මුහුණදීමට කවදත් සහජ හැකියාවක් දක්වූ පෘතුගීසීන් මුස්ලිම් ජනයා අත තිබූ මෙම වෙළඳ ආධිපත්‍යය තමන් සතුකර ගැනීමට වාණිජමය අංශයෙන් පමණක් නොව යුද්ධමය වශයෙන්ද දැඩි ප්‍රයත්නයක යෙදුණු බව පෙනේ. නාවික ශක්තිය අතින් බලවත්වූ පෘතුගීසීන් අවසානයේදී පෙරදිගින් මුස්ලිම් ජනයා පන්නා දමා මෙම කුළුබඩු වෙළඳාම තමන් අතට ගත් බව පෙනේ. එහෙත් ඔවුන්වද

පර්යේෂණ හා පුහුණු කිරීමේ
නිලධාරි

**රංජිත් කුමාරසිරි පතිරණ විසිනි.**

සිත්සේ තමන්ගේ කාර්යය කරගෙන යාමට වැඩිකල් අවසර නොවීය. මෙයට හේතුව වූයේ අපරදිග වෙනත් ජාතීන්ද මෙම වෙළඳාමට සම්බන්ධවීමයි. පිළිවෙළින් පෘතුගීසීන්, ලන්දේසීන්, ප්‍රංශයින් හා ඉංග්‍රීසීන් මෙම කුළුබඩු කොල්ලය පටන්ගත් අතර නාවික ශක්තිය, යුද්ධ බලය දක්වූ එකිනෙකා පරයමින් මෙම කොල්ලය කරගෙන ගිය බව පෙනේ.

මෙම කුළුබඩු කොල්ලය මුලදී වාණිජමය පරමාර්ථයන් පෙරදැරි කරගෙන සිදුවුවත් පසුව එය පෙරදිග රටවල් යටත් කර ගැනීම හා එහි තමන්ගේ ආධිපත්‍යය පිහිටුවීමට දරන අධිරාජ්‍යවාදී අරගලයක් බවට පත් විය. මේ අනුව ශ්‍රී ලංකාවද වසර 450 ක පමණ කාලයක් පෘතුගීසීන්ගේ, ඉංග්‍රීසීන්ගේ හා ලන්දේසීන්ගේ යටත් විජිතයක් බවට පත්වූ අතර එම යටත් විජිත සමාජයේ ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ආර්ථික රටාවට මෙන්ම සමාජ හා සංස්කෘතික පසුතලය වෙතටද එල්ලවූ දරුණු බලපෑම අතිශයින්ම විශාල එකකි.

ලන්දේසීන් හා ඉංග්‍රීසීන් විසින් කෝපි වගාව ශ්‍රී ලංකාව තුළ වාණිජමය භෝගයක් වශයෙන් වගා කිරීමට පටන්ගත් ද සිට ලංකාවේ කෘෂිකාර්මික ග්‍රාමීය සමාජය තුළ පැවති ස්වයංපෝෂිත බව විනාශ වී ගිය බව පෙනේ. වාරි මාර්ග ක්‍රමය ප්‍රධාන කොට ගත් වියලි කලාපයේ කෘෂි ආර්ථික සමාජ ක්‍රමය ක්‍රමයෙන් බිඳවැටීමට පත්වූ අතර සිංහලයා ක්‍රමයෙන් වියලි කලාපය අත්හැර තෙත් කලාපය වෙතට සංක්‍රමණය විය.

අද පවා වියලි කලාපයේ කෘෂිකාර්මික ගමක් දෙස අප නෙත් යොමු කළහොත් දැකිය හැකි විශේෂ ලක්ෂණය නම් ගෙදර



ගොඩ ගොවිතැනේ ආශ්චර්යය: බලපෑමට අසුවීමෙන් වෙනස් වී.

මිදුලේ දක්නට ලැබෙන වී බිස්ස සහ ගෙවත්තේ දක්නට ලැබෙන ගොඩබෝග වගාවයි. විවිධ එළ වළු වර්ග පලතුරු වර්ග මෙන්ම අල බතල වර්ගද දෙහි දොඩම් ආදී කෘෂිකාර්මික ස්වයංපෝෂිත ජීවිතයකට එදිනෙද අවශ්‍ය වන සියළුම බෝග වර්ගද වගාකර තිබෙනු පෙනේ. මෙහි කුළුබඩු වර්ග හා වාණිජමය බෝග වන කෝපි, කොකෝවා හා තේ ශ්‍රී ලාංකික සමාජයට හඳුන්වා දීමත් සමඟම ස්වයංපෝෂිත කෘෂිකාර්මික සමාජය විනාශ වී ගොස් ඒ වෙනුවට වාණිජමය බෝග වගාකරන මුදල් ආර්ථිකයක් වෙතට ශ්‍රී ලංකාව නැඹුරු වීමයි.

මේ තත්වය නිසා තමන්ට ඉතා ලෙහෙසියෙන් එදිනෙද අවශ්‍යතාවයන් වලදී ලබාගත හැකි ගොඩ බෝග වර්ග ගැමියා වගා කිරීම අත්හැරියේ තමන්ට ඊට වඩා වාණිජ බෝගයන්ගෙන් වැඩි වාසිදයක තත්වයක් අත්වේයයි සිතූ නිසාය. විශේෂයෙන් නිරිතදිගතෙත් කලාපය වෙත බටහිර ජාතීන් විසින් හඳුන්වාදුන් කුරුඳු හා රබර් වගාවත් සමගම එම ප්‍රදේශවල තිබූ වාණිජමය නොවන ගොඩ බෝගයන් වෙත දරුණු පහරක් එල්ල වූ අතර සමබර ආහාරයකට අවශ්‍ය පදර්ථ වන එළවළු, පලතුරු, කොස්, දෙල් හා අල බතල වර්ග තමන්ගේ එදිනෙද ආහාර වේලෙන් ක්‍රමයෙන් ඉවත්වී ගොස් පිටරටින් ගෙන්වන ටින් කෑම වර්ග වලට සිංහලයා පුරුදු පුහුණු වූ බව පෙනේ.

මෙවැනි ස්වයංපෝෂිත ආර්ථිකයක් පැවති සිංහල ගැමි සමාජයේ පැරණි ගැමියාගේ මුවින් අද පවා නිකුත්වන වදනක් වශයෙන් ''ඒ කාලයේ අපි ලුණු විතරයි සල්ලි වලට ගත්තේ'' යන්න දැක්විය හැක. වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම මෙය සත්‍යයකි. විශේෂයෙන් වියලි කලාපයේ මෙන්ම තෙත් කලාපයේද ගොවියා අවුරුද්දේ ප්‍රධාන කන්න දෙකකදී වී ගොවිතැනේ නිරත වූ අතර ඉන් තමාගේ ප්‍රධාන ආහාර සපයා ගන්නා ලදී. මීට අමතරව අවුරුද්දේ ඉතිරි කාලයේදී තමන්ට ලැබෙන නිර්මානාත්මක විවේකයේදී ඔහු ඉතා සතුටින් තමන්ගේ ගොඩ බෝගයන් වෙත අවධානය යොමු කළ අතර එමඟින් තමන්ගේ ආහාරයට අවශ්‍ය ඉතිරි පදර්ථ ප්‍රමාණය ලබා ගත්තේය. එහෙත් අධිරාජ්‍යවාදීන්ගේ කුළුබඩු කොල්ලයෙන් ඇරඹී, වතුවගාවෙන් අවසන් වූ මෙම විනාශය ස්වයංපෝෂිත ආර්ථිකය දෙදරා වැටීමට ලක්විය.

ඇත්තෙන්ම කුළුබඩු සොයා ආ අධිරාජ්‍යවාදීන් මේ අනුව ශ්‍රී ලාංකික සමාජයට වාණිජ බෝගයන් හඳුන්වා දීමෙන් ඉතිරි කළේ මන්ද පෝෂණයෙන් පෙළෙන ජනතාවකුත් බටහිර පුහු ආවටා්පයන් ගෙන් මනස පුරවාගත් නිකමුන් රැසකුත් පමණි. මේ අනුව එම විනාශය භෞතික විනාශයක් පමණක් නොව අධ්‍යාත්මික විනාශයක් වශයෙන්ද හැඳින්විය හැක.